ගණිතය පිළිබඳව ආචාර්ය
නලිනි දේවේන්ද්‍ර

(මෙම සාකච්ඡාවේ මුල් කොටස පසුගිය කළාපයේ පළවිණ)

පසුගිය ජනවාරියේ වික්ටෝරියානු අධ්‍යාපන සහතික පත්‍ර (වී.සී.ඊ.) විභාගයේ විශ්ව විද්‍යාල ප්‍රවේශ ප්‍රතිඵල නිකුත් විය. ඉදිරි වසරවල මෙම විභාගයට පෙනී සිටින දරුවන්ගේ දෙමව්පියන් දැනුවත් කිරීමේ අරමුණෙන්, මෙ රට පාසැල් ගුරුවරියක ලෙස නොකඩවා පසුගිය වසර 23 ක සිට සේවය කරන නලිනි දේවේන්ද්‍ර මහත්මිය සමඟ අප කළ සාකච්ඡාවක දෙවන කොටසයි මේ. නලිනි දේවේන්ද්‍ර මහත්මිය ජේරාදෙණිය සරසවියෙන් වසර 4ක විද්‍යාවේදී (ගණිත විශේෂ) උපාධි පාඨමාලාව හදාරා මෙරටදී අධ්‍යාපන වේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමෙන් පසු 1991 වසරේ සිට ගණිත විෂයය උගන්වන ආචාර්යවරියක ලෙස වික්ටෝරියානු පාසැල්වල සේවය කරන්නීය. ඇයගේ අත්දැකීම් තවදුරටත් බෙදා හදා ගැනීමටයි මේ උත්සාහය.

-----"දරුවෙක් අවුරුදු 2 විතරවන විට බහතෝරන-"නට පටන් ගෙන අවුරුදු 18ක් පමණ වන තුරු නිව-සෙන් සහ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබනවා. මේ කාලය තුළදී දරුවන් තමන්ගේ අධ්‍යාපනය සහ බුද්ධිය වර්ධනය කරගන්නා ආකාරය මුලු කාලය තුළම එක විදිහට සිද්ධ වෙන්නේ නැහැ. සමහර දරුවන් තමන්ගේ එක් එක් වයස්වල ශීඝ්‍ර වර්ධනයක් ලබනවා. සමහර කාල වල පසු බසිනවා. සමහර දරුවන් ඉතාම ළදරු වයසේදී කථා කරන්නට පටන්ගෙන ඊළඟට මව්පියන් ගේ ආධාරයෙන් ලිවීම, කියවීම සහ සංඛ්‍යා පිළිබඳ දැනුමක් ප්‍රාථමික පාසැලට යන්නට කලින්ම ලබා ගන්නවා. තවත් සමහර දරුවන් ලියන්නට කියවන්නට පටන් ගන්නේ ප්‍රාථමික පාසැලේ ගතකරන වසර 7 අවසානයේදී ඒ කියන්නෙ 6 වන ශ්‍රේණියේදී මේ දරුවන් දෙකොටසටම දැනුම අතින් එකම මට්ටමක සිටින්නත් පුළුවන්. සමහර දරුවන් යම් යම් දේවලින් අතින් දරුවන්ට වඩා ඉහළින් සිටින්නත් පුළුවන්.

වික්ටෝරියාවේ ප්‍රාථමික පාසැල් බොහොමයක් දන්වාර අවසාන, වසර අවසාන වාර්තාවල දරුවන්ගේ ප්‍රවනතාවය දක්වන්නේ ණීඒ ඒබ්රාඃලඃ ණීඉදඩැ ඒබ්රාඃලඃ ණීඇකක 'ඉදඩැ ඒබ්රාඃලඃ ණීඉකඳඇ ඒබ්රාඃලඃ ණීඇකක ඉකඳඇ ඒබ්රාඃලඃ ආදී වශයෙනුයි. ඉතින් ගෙදරදී අමතර හුගක් වැඩ කරවීමෙන් බොහෝ දරුවන්ව ප්‍රාථමික පාසැලේදී තමන්ගේ පන්තියට වඩා වසරක් දෙකක් ඉදිරියෙන් සිටින තත්ත්වයට ගෙනඑන්නට දෙමව්පියන්ට පුළුවන්. එහෙත් 6 වෙනි ශ්‍රේණියේදී දරුවෙක් ළඟා වී තිබෙන දැනුම මට්ටම සහ බුද්ධි මට්ටම දිහා බලලා ඒ දරුවා ගැන අධිතක්සේරුවක් හෝ අවතක්සේරුවක් ඇතිකරගන්නා එක එතරම් නිවැරදි දෙයක් නෙවෙයි. ප්‍රාථමික පාසැල් කාලය තුළ පිළිවෙලට නිතර ලිවීම කියවීම සහ සංඛ්‍යා දැනුම වර්ධනය වන ආකාරයේ අභ්‍යාසවල නිරතවන බොහෝ දරුවන්ට ප්‍රාථමික පාසැලේ කෙරෙන ඇගැයීම්වලට ඉහළ ළකුණු ගන්නට පුළුවන්. විශේෂයෙන්ම ගණිතය, එහෙම නැත්නම් ප්‍රාථමික පාසැලේදී ඉගැන්වෙන සංඛ්‍යා පිළිබඳ මූලික දැනුම, මූලික ගණිත කම් පිළිබඳව ප්‍රවණතාවය දරුවෙකුට ලබාගන්නට පුළුවනි නොකඩවා අභ්‍යාස කිරීමෙන්. එහෙත් මේ දරුවන්ට සමහරවිට පුහුණුව පමණක් තිබෙන්නට පුළුවන් තමන් කරන දේ ගැන හරි අවබෝධයක් නැතිව. දරුවෙකුට යම් යම් විෂයයන් සඳහා ලැබී ඇති සහජ බුද්ධිය නිසියාකාරව වර්ධනය වී තියෙනවාද කියන එක හරියටම දැනගන්නට හැකිවෙන්නේ ද්විතියික පාසැලේදී අභියෝගවලට මුහුණ දෙන විටයි.

ද්විතියික පාසැලට යන වයසට එළඹෙන විට දරුවන් බොහෝවිට අධ්‍යාපනයට හරි බාගිර වූ නොයෙකුත් දේවල්වලට අවධානයක් යොමු කරනවා. අධ්‍යාපන කටයුතුවල නිරතවන්නට තිබෙන ආසාව අඩු වෙනවා. ඊළඟට තමන් කැමති සහ අකමැති විෂයයන් වශයෙන් විෂයයන් වර්ග කරගෙන, තමන්ට නීරස විෂයයන්හලට යොදවන කාලය අඩු කරනවා. අවරුදු 13, 14, 15 වයසේ දරුවන්ට තමන්ගේ හිතෙන්ම හේතු මවාගෙන යම් යම් විෂයයන් නීරසයි කියා නම් කරන්නට පුළුවන්.

"ඒ විෂයය උගන්වන ගුරුවරයා මට අකමැතියි"

"ඒ විෂයය ඉගෙන ගන්නට මා වැටුණ පන්තියේ මගේ යාළුවන් කවුරුත් නෑ"

ඔයවගේ හේතූන් දරුවන්ට තියෙන්න පුළුවන්.

ඒ වගේම තවත් වැදගත් කාරණයක් තියෙනවා. අප ලංකාවේ ඉගෙන ගත් කාලයේ අප ඉතා වෙහෙසෙන්නට සාමාන්‍යයෙන් මේ රටේ ජීවත් වෙන පරම්පරාවේ දරුවන් නැඹුරු වන්නේ නැහැ. අපි ලමා කාලයේ ලංකාවේ ජීවත් වන විට අපට ජීවිතය ජය ගන්නට තිබුණ එකම මාර්ගය හැටියට පෙනුණේ එහෙම නැත්නම් පෙන්වා දුන්නේ ඉගෙන ගැනීමයි. ඒක මේ රටේ ජීවත්වන දරුවන්ට ඒක ඒ විදිහට පෙනෙයි කියා හිතන්නට අමාරුයි. එහෙම අවබෝධයක් ඒ අයට දෙන්නත් අමාරුයි. ඉතින් අවුරුදු 13 - 14 - 15 කාලයේ බොහෝ දරුවන් පාසැල් වැඩවලට යොදවන්නේ තමන් යෙදිය යුතු අවම කාල ප්‍රමාණය විතරයි.

මේ රටේ පාඨමාලා සකස්වී තිබෙන්නේ මේ සියළු කරුණු ඔලකා බලා, දරුවන්ට 7 ශ්‍රේණියේ සිට 10 වන ශ්‍රේණිය දක්වා වැඩි බරක් දරන්නට සිදු නොවන ආකාරයටයි.

මේ නිසා සාමාන්‍ය බුද්ධි මට්ටමක් ඇති එහෙත් ඉතාම පිළිවෙලට නොපිරිහෙලා පාසැල් වැඩකටයුතු කරන මහන්සිවෙන දරුවන්ටත්, ඉහළ බුද්ධිමට්ටමක් ඇති එහෙත් පාසැල් වැඩ අතපසු කරන, අවසාන මොහොතේදී විභාගවලට සූදානම් වන දරුවන්ටත් සමහර විට එකම උසස් ප්‍රතිඵලය ලබාගන්නට පුළුවනි 7 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා කාලයේදී.

10 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය වෙත ළඟාවෙන දරුවාට දැනුම මැනීමේ කඩඉම් පරීක්ෂණයක් මේ රටේ නැහැ. ඕනෑම දරුවෙකුට තමන් කැමති විෂයයක් තෝරාගන්නට 11 වන ශ්‍රේණියේදී අවසරය තියෙනවා. එහෙත් මෙතනදි තමයි එක් එක් විෂය සඳහා අවශ්‍යවන යෝග්‍යතාවයන්, ඒවගේම පිළිවෙලකට පාඩම්වැඩ අතපසු නොකර කිරීමට, ස්වාධීනව පාඩම් වැඩවල යෙදෙන්නට අවශ්‍යවන සවියං විනයන් දෙකම අත්‍යාවශ්‍ය වන්නේ.

මොකද මොනතරම් ඉහළ බුද්ධිමට්ටමක් ඇති දක්ෂ දරුවෙක් වුණත් ඔහු හෝ ඇය පිළිවෙලට වැඩකරන්නට දන්නෙ නැත්නම්, වී. සී. ඊ. පන්තිවල ඉගැන්වෙන විෂයන් ඉගෙන ගැනීමත් උසස් ප්‍රතිඵල ලබාගැනීමත් ලොකු අභියෝග්‍යත් වෙනවා.

ඒ වගේම තමයි, මොනතරම් පිළිවෙලට මහන්සි වී වැඩකරන දරුවෙක් වුණත් ඔහුට හෝ ඇයට තමන් තෝරාගත් විෂයයන් ගැන යෝග්‍යතාවයක්, සහජ දක්ෂ කමක් නැත්නම්, එවැනි දරුවන්ටත් වී.සී.ඊ. විෂයයන් හරියට හදාරන්නට, උසස් ප්‍රතිඵල ගන්නට අමාරු වෙනවා.

ඉතින් දෙමව්පියන් විසින් කළයුතු ඥාණාන්විත දේ තමයි දරුවන් සමග ෂමීප සම්බන්ධතාවය ගොඩනගාගෙන ප්‍රාථමික පාසැල් වයසේ සිටම පිළිවෙලට කාලය අපතේ නොයවා පාසැල් වැඩ කිරීමට පුරුදු පුහුණු කරන එක. එහෙම කරන අතරම තමන්ගේ දරුවාගේ බුද්ධිය වර්ධනය වන්නේ මොන අකාරයටද දරුවා යොමු කළ යුත්තේ මොන පැත්තටද කියන එක ගැනත් ඉතාම කල්පනා කාරීව සිටින එක, ඒ ගැන අවබෝධයක් ලබාගන්නා එකත් අත්‍යාවශ්‍යයි.

ඉතිරි කොටස ලබන කළාපයේ

ගණිතය පිළිබඳව ආචාර්ය නලිනි දේවේන්ද්‍ර සමග සාකච්ඡා කළේ:
සිසිර දිසානායක



සිංහල භාෂා පාසල
St Albans

හෙළ සංස්කෘතික හැඳියාව ඔබේ දරුවාටත් දායාද කරන්නට ඔබ කැමතිද?

භාෂාව නොමැති විට සංස්කෘතිය ද නොපවතී.
සිංහල භාෂාව හැදෑරූ අපේ දරුවෝ තමන් අද සමාජය ජය ගෙන යහපත් පුරවැසියන් වී ඇති බවට සාක්ෂි දරති

කවි, සිංදු, නැටුම්, නාට්‍ය ඇතුළු ආගමික සංස්කෘතික පසුබිමක් සහිතව ඉගැන්වෙන පාඨමාලා ඇතුළත් St Albans සිංහල භාෂා පාසලට ඔබේ දරුවා ද ඇතුලත් කරන්න.

2014 සඳහා ළමුන් බඳවා ගැනීම පෙබරවාරි 2 සිට සිදුකරනු ලැබේ.

පන්ති පැවැත්වෙන වේලාව - ඉරිදා ප.ව. 2.30 – 5.30

ස්ථානය
Taylors Lake Secondary College
39, Parmelia Drive, Taylors Lake 3038

විමසීම්
9747 1902, 0425 855 621